සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved ]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# මධ්‍ය වාර ඇගයීම - 2013
# Mid Term Assessment - 2013

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | බුද්ධ ධර්මය I<br>Buddhism Paper I | *පැය 1 යි*<br>*1 Hours* |

➢ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ලෝකයේ ජීවී අජීවී සියල්ලම ත්‍රිලක්ෂණ ධර්මයට යටත් වේ. පංචස්කන්ධයේ යථාර්ථය ත්‍රිලක්ෂණයට නගා වඩන භාවනාව හඳුන්වන්නේ.

(i) ආනාපානසති භාවනාව යනුවෙනි. (ii) මෛත්‍රී භාවනාව යනුවෙනි.

(iii) බුද්ධානුස්සති භාවනාව යනුවෙනි. (iv) විපස්සනා භාවනාව යනුවෙනි.

(2) ඔබ විහාරස්ථානයට ගොස් කළයුතු වතාවත් අවසානයේ පුද පූජාවන් තැන්පත් කර අනුපිළිවෙලින් වන්දනා කරන්නේ.

(i) පිළිම වහන්සේ, බෝධිය, ස්තූපය. (ii) බෝධිය, ස්තූපය, පිළිම වහන්සේ,

(iii) ස්තූපය, බෝධිය, පිළිම වහන්සේ, (iv) පිළිම වහන්සේ,, ස්තූපය, බෝධිය.

(3) මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කර පළමුවෙන්ම ශ්‍රී ලාංකිකයන්ට දේශනා කළ සූත්‍රය වන්නේ.

(i) චූල්ලකම්ම විභංග සූත්‍රය ය. (ii) දම්සක් පැවැතුම් සූත්‍රය ය.

(iii) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය ය. (iv) මහා මංගල සූත්‍රය ය.

(4) බුදු දහමට අනුව අධාර්මික ජීවනෝපායක් නොවන්නේ

(i) අවි අයුධ වෙළදාමයි. (ii) මස් වෙළදාමයි.

(iii) වස විස වෙළදාමයි. (iv) ගාව පාලනයයි.

(5) පුද්ගලයාගේ සිත කිළිටි කරන නිවන් මඟ අහුරණ නීවරණ ධර්ම 5 ක් බුදු දහමේ දේශනාකොට ඇත. එහි විචිකිච්ඡා නීවරණය උපමා කරන්නේ.

(i) උතුරණ වතුරටය. (ii) බොර වතුරටය.

(iii) පාටකළ වතුරටය. (iv) සෙළවෙන වතුරටය.

(6) උත්සාහයෙන් හා වීර්යයෙන් කටයුතු කරන පුද්ගලයාට සමාජයේ මිනිසුන් අතර කීර්ති ප්‍රශංසා ලබන්නෙකු ලෙස ගෞරවයට පත්විය හැකිය. ඒ පිළිබඳව කියැවෙන ධමමපද ගාථාවෙහි එබඳු පුද්ගලයෙකුගේ ලක්ෂණ 7ක් දක්වා ඇත. එම ධම්මපද ගාථාව නම්.

(i) උට්ඨානවතො සතිමතො යන ගාථාවය. (ii) අක්කොච්ඡිමං අවධිමං යන ගාථාවය.

(iii) නහි වේරේණ වේරානි යන ගාථාවය. (iv) වරංචෙනාදි ගච්ජෙය්‍යා යන ගාථාවය.

(7) බුදුරජාණන් වහන්සේගේ කේශධාතූන් වහන්සේ හා ග්‍රීවාධාතූන් වහන්සේ තැන්පත් කොට ඉදිකළ දාගැබ හඳුන්වන්නේ.

(i) ථූපාරාමය දාගැබ නමිනි. (ii) සෝමාවතී දාගැබ නමිනි.

(iii) කැළණිය දාගැබ නමිනි. (iv) මහියංගණය දාගැබ නිමිනි.

(8) සම්බුද්ධ දේශනාවට අනුව නොකළ යුත්ත පාපයයි. අකුසලයයි. ඉන් වැළකීම බුදු දහමේ සීල ශික්ෂාවට අනුව.

(i) අධම්ම චරියා නම් වේ. (ii) සමාදානය නම් වේ.

(iii) විරමණය නම් වේ. (iv) සදාචාරය නම් වේ.

(9) සිගාල ගෘහපති පුත්‍රයාට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සමාජ සබඳතාවන්ගේ ධාර්මික පිළිවෙත සදිසා නමස්කාරයයි. මේ ඉගැන්වීම ඇතුළත් සූත්‍ර දේශනාව.

(i) ද්‍රෝණ සූත්‍රයයි. (ii) සිගාලෝවාද සූත්‍රයයි.

(iii) පත්ත කම්ම සූත්‍රයයි. (iv) කරණීය මෙත්ත සූත්‍රයයි.

(10) බුද්ධ කාරක ධර්ම සම්පූර්ණ කිරීමේදී ශාරීරික අංගවලට සිදුවන හානිය ගැන නොසලකා ඉවසීම

(i) ක්ෂාන්ති පාරමිතාවයි. (ii) ක්ෂාන්ති උප පාරමිතාවයි.

(iii) ක්ෂාන්ති පරමත්ථ පාරමිතාවයි. (iv) මෙත්තා උපපාරමිතාවයි.

(11) බුද්ධ කාලීන වජ්ජි සමූහාණ්ඩුවේ පාලන රටාව බුදු රජාණන් වහන්සේගේ විශේෂ ඇගයීමට ලක් වූයේ වජ්ජීන් අනුගමනය කළ.

(i) සප්ත අපරිහානීය ධර්ම ප්‍රතිපත්තිය නිසාය.

(ii) දස සක්විතිවත් ප්‍රතිපත්තිය නිසාය.

(iii) දසරාජ ධර්ම ප්‍රතිපත්තිය නිසාය.

(iv) පංචසීල ප්‍රතිපත්තිය නිසාය

(12) විශාලා මහනුවර ඇතිවූ තුන්බිය දුරුකරලීමට බුදු රජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළ සේක. එමෙන් ශ්‍රී ලංකාවේදි පළමු වැනි උපතිස්ස රජු දවස දුර්භික්ෂ භය හා රෝග භය දුරලීමට එක් සුවිශේෂ පූජාවක් පැවැත්වූ බව වංශ කථාවල සඳහන් වෙයි. එම පූජෝත්සවය නම්.

(i) අග්‍රශස්‍ය දානයයි. (ii) අරිය වංශ සූත්‍ර දේශනාවයි.

(iii) ගිරිභණ්ඩ පූජාවයි. (iv) ගංගා රෝහණ පූජාවයි.

(13) දැතේ දෙපයේ වෙර විර්යයෙන් දහදිය වගුරුවමින් අධාර්මික පිළිවෙතින් බැහැරව ධනය උපයාගෙන ධාර්මික ජීවන රටාවක් පවත්වාගෙන යාම ආර්ය අෂ්ටාංගික මාර්ග පිළිවෙතට අනුව.

(i) සම්මා කම්මන්තයයි. (ii) සම්මා ආජීවයයි.

(iii) සම්මා වායාමයයි. (iv) සම්මා සංකප්පයයි.

(14) දරුවන්ට නිවැරදිමඟ කියා දෙමින් ඔවුන් යහමගට යොමු කරන ජීවිතයේ මුල්ම පාඩම කියාදෙන අර්ථයෙන් අපේ දෙමව්පියන් බුදු දහමේ එක් සුවිශේෂ වචනයකින් හඳුන්වා ඇත. එනම්.

(i) පුබ්බ දේව යනුවෙනි. (ii) ආහුණෙය්‍ය යනුවෙනි.

(iii) බ්‍රහ්ම යනුවෙනි. (iv) පුබ්බාචරිය යනුවෙනි.

(15) බෝධින් වහන්සේ බෞද්ධ සමාජය තුළ පූජනීය වස්තුවකි. ධර්මාශෝක මහාධිරාජයා පවා බෝධි වන්දනය කළ බව සඳහන් වෙයි. සුවඳ පැණින් හා කිරි දියරෙන් නහවා පුද පූජා පවත්වයි. බෝධි වන්දනාව අයත් වන්නේ.

(i) පාරිභෝගික චෛත්‍ය වන්දනාවටය. (ii) ශාරීරික චෛත්‍ය වන්දනාවටය.

(iii) උද්දේශික චෛත්‍ය වන්දනාවටය. (iv) වෘක්ෂ වන්දනාවටය.

(16) පංචසීල ප්‍රතිපදාව පුද්ගල ජීවිතය ශික්ෂණයට පමුණුවනවා පමණක් නොව උසස් සාමාජික අගයකින් යුත් පිළිවෙතක්ද වෙයි. එහි නිරෝගී බුද්ධිමත් සාමකාමී ජීවිතයක් ගත කිරීමට සියලුම පුරවැසියන්ට ඇති අයිතිය පිළිගෙන තිබේ. මේ අදහස දෙන්නේ පංච සීලයේ.

(i) දෙවන ශික්ෂා පදයෙනි. (ii) තෙවන ශික්ෂා පදයෙනි.

(iii) සිව්වන ශික්ෂා පදයෙනි. (iv) පස්වන ශික්ෂා පදයෙනි.

(17) සීත උෂ්ණාදී පාරිසරික බලපෑම් වලින් ද වායු දූෂණයෙන්ද තොරවූ යහපත් සෞඛ්‍ය සම්පන්න නිරෝගි ජීවන රටාවකට බුදු දහම උපදෙස් දෙයි. මෙහිදී උණුසුම් කාලයේදී වා කවුළු ආදිය පරිහරණය කළයුතු ආකාරය ද දේශනා කර ඇත. ඒ අනුව වා කවුළු භාවිත කළ යුත්තේ.

(i) දිවා කාලයේ වසා තබා රාත්‍රි කාලයේ විවෘතව තැබිය යුතුය.
(ii) දිවා කාලයේ විවෘතව තබා රාත්‍රි කාලයේදී වසා තැබිය යුතුය.
(iii) දිවා රාත්‍රි දෙකේම වසා තැබිය යුතුය..
(iv) දිවා රාත්‍රි දෙකේම විවෘතව තැබිය යුතුය.

(18) බුදු රජාණන් වහන්සේ පද්මාකාර ජීවන ප්‍රතිපදාවකින් යුක්තවූ සේක. එම පිළිවෙත ආදර්ශයට ගෙන ක්‍රියාකරන ගිහි ප්‍රතිපදාව නම්.

(i) සල්ලේඛ ප්‍රතිපදාවයි. (ii) මධ්‍යම ප්‍රති පදාවයි.
(iii) අත්ථ කුසල ප්‍රතිපදාවයි. (iv) අනගාරික ප්‍රතිපදාවකි.

(19) බුද්ධත්වය පතා පාරමිතා පිරූ බෝසතාණන් වහන්සේ ප්‍රඥා පාරමිතාව පිරූ බව විස්තර කරන ජාතක කතාවක් වන්නේ.

(i) තේමිය ජාතකයයි. (ii) උම්මග්ග ජාතකයයි.
(iii) මඛාදේව ජාතකයයි. (iv) වණ්ණුපථ ජාතකයයි.

(20) සමස්ත බුදු දහම සූත්‍ර, විනය, අභිධර්මය යනුවෙන් ත්‍රිපිටකයක් ලෙස සංග්‍රහ කර ඇත. ධම්ම පදය අයත් වන්නේ සූත්‍ර පිඨකයේ.

(i) සංයුත්ත නිකායටයි. (ii) ඛුද්දක නිකායටයි.
(iii) අංගුත්තර නිකායටයි. (iv) දීඝ නිකායටයි.

(21) එදිනෙදා ජීවිතයේදී විවිධ චරිත ලක්ෂණයන්ගෙන් යුත් මිනිසුන් ඇසුරු කිරිමට අපට සිදුවන අතර ඔවුන් පහසුවෙන් හඳුනා ගැනීම දුෂ්කරය. එවැනි චරිත හයක් බුදු දහමේ වර්ග කොට ඇත. එම වර්ගී කරණයට අයත් නොවන චරිතයකි.

(i) රාග චරිතයයි. (ii) ශ්‍රද්ධා චරිතයයි. (iii) වීර චරිතයයි. (iv) දෝෂ චරිතයයි.

(22) දිනක් එක්තරා දේවතාවෙක් බුදු රජාණන් වහන්සේ වෙත එළැඹ දිවා රාත්‍රි පිං වැඩෙන කුසල ක්‍රියා මොනවාදයි විමසුවේය. ඒ පැනයට බුදුරජාණන් වහන්සේ ලබාදුන් පිළිතුරක් නොවන්නේ.

(i) මල් පළතුරු උයන් වගා කිරීමය.
(ii) ස්වාභාවික වනාන්තර ආරක්ෂා කිරීමය.
(iii) ඒ දඬු පාලම් පැන්හල් පොකුණු තැනීමය.
(iv) වනාන්තර එළිකිරීමය.

(23) බුදු දහමට අනුව තිදොරින් අප කරන කර්ම චේතනාව මුල්කරගෙනම සිදු කරයි. ඒ අනුව කුසල කර්ම සඳහා මුල් වන්නේ.

(i) අලෝභ, අදෝෂ, අමෝහ, චේතතාවන්ය. (ii) ලෝභ, දෝෂ, මෝහ, චේතනාවන්ය.
(iii) පංච නියාම ධර්මයන්ය. (iv) මේ සියල්ලමය.

(24) භවත්නි නොයෙක් දහස් ගණන් දෙවියෝ මහණ ගොයුමන් දිවි හිමියෙන් සරණ ගියහ. යනුවෙන් බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අගය කළ සමකාලීන පඬිවරයා වන්නේ.

(i) ශ්‍රි නේරු තුමාය. (ii) මන්මථනාත් ශ්‍රී නාත් තුමාය.
(iii) සෝණ දණ්ඩ බමුණාය. (iv) උපාලි ගෘහපති තුමාය.

(25) "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායති භාවනා" ඉහත පාලි පාඨයට වඩාත් ගැලපෙන අර්ථය නම්.

(i) කෙලෙස් ධර්ම යටපත් කිරීම භාවනාවයි.
(ii) ජීවිතය හා ලෝකය දෙස විශේෂයෙන් බැලීම භාවනාවයි.
(iii) කුසල් දහම් වැඩි දියුණු කිරීමේ මානසික අභ්‍යාසය භාවනාවයි.
(iv) සිතේ ඇතිවන නොසන්සුන් තාවයන් මග හැරීම භාවනාවයි.

(26) ගිහියෙකුට අත්විඳිය හැකි සැප 4 ක් අණන සූත්‍රයේදී විස්තර කරයි. එහි ධනය පරිභෝජනය කිරීමෙන් ලබන සතුට හඳුන්වා ඇත්තේ.

(i) අත්ථි සුඛ යනුවෙනි.
(ii) භෝගසුඛ යනුවෙනි.
(iii) අණන සුඛ යනුවෙනි.
(iv) අනවජ්ජ සුඛ යනුවෙනි.

(27) මෛත්‍රී භාවනාවේ ආනිසංස 11 ක් මෙත්තානිසංස සූත්‍රයේ ඉගැන්වේ ඒ අතරට අයත් නොවන්නේ මෛත්‍රිය වැඩීමෙන්.

(i) මුහුණ පැහපත්වේ.
(ii) සුවසේ අනුභව කරයි.
(iii) සිහිමුලා නොවී කළුරිය කරයි.
(iv) දෙවියන්ට ප්‍රිය වෙයි.

(28) නිදහස්ව සිතීමෙන් හා විමසීමෙන් යමක් නිවැරදිව අවබෝධ කරගත හැකිය. මේ දේශනාව සඳහන් වන්නේ.

(i) සිගාල ගෘහපතියාට දේශනා කළ සිගාලෝවාද සූත්‍රයේය.
(ii) කාලාම ගෝත්‍රිකයන්ට දේශනා කළ කාලාම සූත්‍රයේය.
(iii) දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේය.
(iv) ද්‍රෝණ බමුණාට දේශනා කළ ද්‍රෝණ සූත්‍රයේය.

(29) "සියල්ල පෙර කරන ලද කර්ම වලට අනුව සිදුවේ"ය යන ඉගැන්වීම.

(i) නිර්මාණ වාදයයි.
(ii) පුබ්බේකත හේතුවාදයයි.
(iii) අහේතු අප්පච්චය වාදයයි.
(iv) හේතුඵල වාදයයි.

(30) සත්වයා නැවත නැවත සසර ඉපදීම පිළිබඳව අවබෝධ කර ගැනීමට උපදවා ගත යුතු ඥානය.

(i) දිබ්බ චක්ඛු ඤාණය යි.
(ii) අනාවාරණ ඤාණය යි.
(iii) චුතූපපාත ඤාණය යි.
(iv) ආසවක්ඛය ඤාණය යි.

(31) වරිත් නිතර පංසල් යයි. බෝමළුව විහාරය අමදියි බුද්ධ ප්‍රතිමාව දෙස ගෞරවයෙන් බලා සිටියි. බෞද්ධ චරිත විග්‍රහය අනුව වරිත් තුළ ඇත්තේ.

(i) විතක්ක චරිතයකි.
(ii) මෝහ චරිතයකි.
(iii) දෝෂ චරිතයකි.
(iv) ශ්‍රද්ධා චරිතයකි.

(32) හේතුඵල දහමේ අනුලෝම චක්‍රයට අනුව භවය නිසා හට ගන්නේ.

(i) තණ්හාවයි.
(ii) නාම - රූපයි.
(iii) ජරා - මරණය.
(iv) ජාතිය හෙවත් ඉපදීමයි.

(33) බෞද්ධ ඉගැන්වීම් අනුව දෙමාපියෝ නම් සතර බ්‍රහ්ම විහරණ වලින් පිරිපුන් උත්තමයෝය. සතර බ්‍රහ්ම විහරණයන් ලෙස බුදු දහමේ දැක්වෙන්නේ මෙත්තා කරුණා මුදිතා උපේක්ඛා යන ගුණයන්ය. මෙහි මුදිතා යනු.

(i) දරුවන්ට ඇති හිතවත් භාවයයි.
(ii) දරුවන්ට ඇති කරුණාවන්ත භාවයයි.
(iii) දරුවන්ගේ දියුණුව දැක සතුටු වීමයි.
(iv) දරුවන් පිළිබඳව මැදහත්ව කටයුතු කිරීමයි.

(34) "දන්ත කුමරු හා හේමමාලා කුමරිය" ඉන්දියාවේ කලිඟු රට සිට දළදා වහන්සේ ද රැගෙන් "ලංකා පටුන" නම් වරායෙන් ගොඩ බැස ශ්‍රී ලංකාවට පැමිණියහ. එවකට ලංකාවේ රාජ්‍ය කළේ.

(i) දුටු ගැමුණු රජතුමාය.

(ii) කිත්සිරි මේවන් රජතුමාය.

(iii) දේවානම්පිය තිස්ස රජතුමාය.

(iv) පළමු වන උපතිස්ස රජතුමාය.

(35) බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට වස් විසීමේ ශික්ෂා පදය අනුදැන වදාළේ පාරිසරික අරමුණක් ද ඇතිවය එනම්.

(i) තණ කොළ ආදි කුඩා ශාකයන් වුවද ආරක්ෂා කිරීමේ අරමුණෙනි.

(ii) කඨින සිවුරක් පූජා කිරීමේ අරමුණෙනි.

(iii) විහාරස්ථාන සංවර්ධනය කිරීමේ අරමුණෙනි.

(iv) පරිසරය අපවිත්‍ර නොකිරීමේ අරමුණෙනි.

(36) සංවර්ධිත සමාජයක තිබිය යුතුම විශිෂ්ට ලක්ෂණයක් ලෙස ඔබ දකින්නේ.

(i) සිලාචාර කමයි.

(ii) ආර්ථික සංවර්ධනයයි.

(iii) සංචාරකයින්ගේ පැමිණීමයි

(iv) නිදහසේව ජීවත්වීමයි.

(37) මිනිසුන් අතර නිතර නිතර අවුල් වියවුල් හට ගැනීමට බලපාන ප්‍රබලම සාධකය නම්

(i) විරැකියාවයි.

(ii) නූගත් කමයි.

(iii) අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයි.

(iv) කෙලෙස් පිරුණු මිනිස් සිතයි.

(38) මම, මගේ යන සංකල්ප පහදා දීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ "අනත්ත ලක්ඛන" සූත්‍රයෙන් විවරණය වන්නේ.

(i) ස්ථිර වූ ආත්මයක් ඇති බවයි.

(ii) පංචස්කන්ධයේ ආත්ම වශයෙන් ගත හැක්කක් නැති බවයි.

(iii) ආත්ම සංකල්පය අතීතයේ සිටම පවතින බවයි.

(iv) අජීවී ලෝකයටද ආත්ම සංකල්පය පොදු බවයි.

(39) බුදුන් වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජකයාගේ ආරාමයට වඩින බව දුටු පොට්ඨපාද පරිබ්‍රාජකයා තම ශ්‍රාවකයන්ට ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරන්නේ බුදුන් වහන්සේ

(i) නිශ්ශබ්දතාවය කැමැති බවයි.

(ii) සිල්වත් බව අගයන බවයි.

(iii) අසමාන රූප සම්පත්තියෙන් යුක්ත බවයි

(iv) ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකු බවයි.

(40) පුද්ගලයෙකුගේ ඊළඟ භවය කෙරෙහි බලපාන කර්මය වන්නේ.

(i) ආසන්න කර්මයයි.

(ii) උපපීලක කර්මයයි.

(iii) ජනක කර්මයයි.

(iv) උපස්ථම්භක කර්මයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved ]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# මධ්‍ය වාර ඇගයීම - 2013
# Mid Term Assessment - 2013

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | බුද්ධ ධර්මය II පත්‍රය<br>Buddhism Paper II | පැය දෙකයි<br>*Two Hours* |
|---|---|---|

- ➢ පළමු ප්‍රශ්නය අනිවාර්ය.
- ➢ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 ක පිළිතුරු සපයන්න.

(01) (i) සම්මා දිට්ඨිය බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(ii) සාරංච සාරතො ඤත්වා - අසාරංච අසාරතෝ යන පාඨ දෙකේ තේරුම ලියන්න.

(iii) විදර්ශනා භාවනාව හෙවත් විපස්සනා භාවනාව හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.

(iv) අමාලි පාසලට පැමිණි වේලාවේ සිට දැඩි තරහවකින් හා නොසන්සුන්තාවයකින් කටයුතු කරන බව පංතිභාර ගුරුතුමිය දුටුවාය අමාලි තුළ මේ ස්වභාවයට බලපාන නීවරණ ධර්ම දෙක නම් කරන්න.

(v) අනුරාධපුර මහමෙව්නා උයනේ ඇති සමාධි බුද්ධ ප්‍රතිමාව ලොව විශිෂ්ටතම නිර්මාණයකි එහි ආසනය හා මුද්‍රාව නම් කරන්න.

(vi) පංචස්කන්ධය නාම-රූප වශයෙන් දෙකොටසකි නාම කොටසට අයත් අංග දෙකක් ලියන්න.

(vii) බුදු දහමට අනුව අධිපති ධර්ම තුනකි. ඉන් දෙකක් නම් කරන්න.

(viii) ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද දෙකක ලියන්න.

(ix) ජනතා සුභ සිද්ධිය අපේක්ෂා කරන පාලකයා සතර අගතියෙන් තොරව රටක් පාලනය කළ යුතුය. සතර අගතියෙන් කරුණු දෙකක් ලියන්න.

(x) කයින් සිදුවන කුසල කර්මයක් හා අකුසල කර්මයක් නම් කරන්න.

ලකුණු 2×10 =20

(2) පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා අන්‍යෝන්‍ය විශ්වාසය හා සමාජයේ ජීවත් වීම පිළිබඳව විශිෂ්ඨතම දේශනාව සිඟාලෝවාද සූත්‍රයයි.

(i) බුදුරජාණන් වහන්සේ දේශනා සදිසාවන්ට අනුව නැගෙනහිර හා දකුණ යන දිසාවන් වලින් අර්ථවත් වන්නේ කුමන සමාජ කණ්ඩායම් ද ?.

(ii) දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) 'මව්පිය උපස්ථානය දෙලොව යහපත පිණිස හේතු වේ' මේ පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

ලකුණු 2+3+5 =10

(3) බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව මුලික බුදු දහමේ හරය පැහැදිලි කරයි. සත්වයා ලෝකය පිළිබඳව සත්‍යතාවය මනාව විස්තර කරයි.

(i) එම සත්‍යතාවයන් ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද එය දේශනා කළේ කාටද ?.

(ii) චතුරාර්ය සත්‍යයේ අංග දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

(iii) මෙලොව ජිවිතයේදී ඔබට ඇතිවන ගැටළු හා ඒවාට පිළියම් යෙදීමට චතුරාර්ය සත්‍ය ධර්ම දේශනාව ඉවහල් කරගත හැකි ආකාරය විස්තර කරන්න.

ලකුණු 2+3+5=10

(4) මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකීය ආගමික හා සමාජ ජන ජීවිතය බුදු දහම හා බෞද්ධ සංස්කෘතිය පදනම් කරගෙන උසස් විය ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය ආගමික පරිසරයක් තුළම සකස් විය.

(i) මහින්දාගමනයෙන් අපට ලැබුණු පූජෝත්සව දෙකක් ලියන්න.

(ii) අග්‍රශස්‍ය දානය යනු කුමකද් දැයි පැහැදිලි කරන්න.

(iii) බෝධීන් වහන්සේ හා බෞද්ධයාගේ ජන ජීවිතය සම්බන්ධ වී ඇති අයුරු විස්තර කරන්න.

ලකුණු 2+3+5=10

(5) සොඳුරු පරිසරය මිනිසා ඇතුළු සියල්ලන්ගේ පැවැත්මට හේතු වන බැවින් අප පරිසරයට ආදරය කළ යුතුය බුදු රජාණන් වහන්සේ.

(i) පරිසරයේ සුරක්ෂිතතාවය තහවුරු කරමින් තම ආරාම ජීවිතය සකස් කර ගැනීමට උපදෙස් දුන් අවස්ථා දෙකක් ලියන්න.

(ii) වායු දූෂණයට බලපාන මානව ක්‍රියා කාරකම් තුනක් ලියන්න.

(iii) "පරිසරය මගේය" යන උදාර හැගිම සියළු මිනිසුන් තුළම ඇති වුහහොත් කෙබඳු ප්‍රතිඵලයක් උදාවේදැයි කරුණු දක්වන්න.

ලකුණු 2+3+5=10

(6) බුද්ධත්වය පතා බෝසත් උතුමන් විසින් සම්පූර්ණ කළ යුතු ගුණ විශේෂය බුද්ධකාරක ධර්ම නම් වේ.

(i) බුද්ධකාරක ධර්ම දෙකක් ලියා එම ගුණ විශේෂය ප්‍රකටවන ජාතක කථා දෙක ලියන්න.

(ii) ඉගෙනීම සඳහා ඔබ තුළ ඇති අලස බව දුරු කර උත්සාහය වර්ධනය කරනු ලබන්නේ විර්යයයි. විර්ය පාරමිතාවේ ලක්ෂණ තුනක් නම් කරන්න.

(iii) ඉවසීම උත්සාහය හා අධිෂ්ඨානය යන ගුණාංග සාර්ථක ජීවිතයක් ගොඩනැගිමට ඉවහල්වන අයුරු විස්තර කරන්න.

ලකුණු 2+3+5=10

(7) තමාට අකටයුතුකම් හා හිරිහැර කළ වුන් පිළිබඳව නිතර සිහිනොකරන පුද්ගලයාගේ සිතෙහි - වෛරයක් නුපදී.

(i) ඉහත අදහසට වඩාත් ගැලපෙන ධම්මපද ගාථාව ලියන්න.

(ii) එහි සරල අදහස ලියන්න.

(iii) එදිනෙදා ජීවිතය සාමකාමීව පවත්වා ගැනීමට ධම්මපදයේ උපදෙස් ඔබට ඉවහල් කර ගතහැකි අයුරු පෙන්වා දෙන්න.

ලකුණු 2+3+5=10